# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING


මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94) - 11 - 2449823

වෙබ් අඩවිය / வெப்சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: බ්ඩ්ජ්/965/1/476

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2007.12.31

**ජාතික අයවැය චක්‍රලේඛ අංක 137**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්/

දෙපාර්තමේන්තු ප්‍රධානීන්/සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ

රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත,

**<u>2008 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා</u>**

**<u>බලය දීම සහ රාජ්‍ය වියදම් කළමනාකරණය</u>**

## 1. 2008 වර්ෂය සඳහා වියදම් දැරීමේ අධිකාරී බලය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව 2007 දෙසැම්බර් 14 වෙනි දින පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබූ 2007 අංක 61 දරන විසර්ජන පනතට අනුව 2008 අයවැය ඇස්තමේන්තුවල ඇතුලත් ප්‍රතිපාදන වියදම් කිරීම සඳහා අදාළ අධිකාරී බලපත්‍ර ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් අත්සන් තබා ඇත.

ඒ අනුව ගෙවීම් වවුචර්පත් හා වෙනත් ලියවිලි මත පහත සඳහන් පරිදි අදාළ අධිකාරිය සටහන් කළ යුතු වේ.

(අ) සාමාන්‍ය පොදු සේවා සඳහා 2008 අංක 01 දරන සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය.

(ආ) විශේෂ තිති සේවා කටයුතු සඳහා 2008 අංක 01 දරන විශේෂ තිති සේවා අධිකාරිය.

(ඇ) අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා 2008 අංක 01 දරන අත්තිකාරම් වොරන්ට් බලපත්‍රය.

## 2. රාජ්‍ය වියදම් කළමනාකරණය

2.1 2008 අයවැය කථාවෙන් යෝජිත පරිදි විසර්ජන පනත් කෙටුම්පත සමඟ ඉදිරිපත් කරනු ලැබූ 2008 අයවැය ඇස්තමේන්තු මඟින් සළසා ඇති පුනරාවර්තන ප්‍රතිපාදන වලින් වැටුප් හා වේතන, විශ්‍රාම වැටුප්, සහනාධාර හා රාජ්‍ය ණය සඳහා වූ පොලී ගෙවීම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන හැර අනෙකුත් ප්‍රතිපාදන වලින් 1.5% ක් ද, මූලධන වියදම් වලින් 7% ක් ද, රජයේ වියදම් සැකසුරුවම් ලෙස කළමනාකරණය කිරීමේ අපේක්ෂාවෙන් අවුරා තබනු ලැබේ. ඒ අනුව සියළුම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් යෝජිත අඩු කිරීම් ඇතුලත් වන පරිදි වියදම් ආයතනය සඳහා සකස් කළ සංශෝධිත ඇස්තමේන්තුවක් 2008.01.18 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය. එලෙස සංශෝධිත ඇස්තමේන්තුවක් නියමිත දිනට ප්‍රථම ඉදිරිපත් කරනු නොලැබුවහොත්, 2008 පෙබරවාරි මාසය සඳහා මුදල් අග්‍රිම ලබා දීම ප්‍රමාදවීමට එය හේතුවනු ඇත.

2.2 මෙම අපේක්ෂිත ඉතුරුවීම් හඳුනා ගැනීමේදී, 2007 අයවැය යටතේ දැනටමත් වැඩ ආරම්භ කර එහෙත් වැඩ අවසාන කර නොමැති ව්‍යාපෘති හැර නියමිත ඉලක්ක ළඟා කර ගැනීමට අපොහොසත් වූ ව්‍යාපෘති පළමුවෙන් හඳුනාගත යුතුය. එසේම, ප්‍රමුඛ නොවන මූලධන වැඩසටහන් කල් දැමීම, නාස්තිය සහ දූෂණය අවම කර ගැනීම, අරපිරිමැස්මෙන් යුතුව වියදම් දැරීම තුළින් ද අපේක්ෂිත ඉතිරිවීම සලසා ගත හැකි වනු ඇත.

2.3 මොනම හේතුවක් නිසාවත් එසේ අවුරා තබන ලද වැය විෂයයන් සඳහා අතිරේක ප්‍රතිපාදන හෝ මු.රෙ.66 මාරුවීම් හෝ ලබා දීමට කටයුතු කරනු නොලැබේ. එබැවින් එම වියදම් පවතින ප්‍රතිපාදන මත කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු වේ.

## 3. අතිරේක මූල්‍ය අවශ්‍යතාවයන් පිළිබඳව සලකා බැලීම

3.1 2008 වර්ෂයේ සම්මත අයවැය ඇස්තමේන්තු මගින් සලසා ඇති ප්‍රතිපාදන ඇතුළත තම ආයතනයන්හි වාර්ෂික වියදම් දැරීම වඩාත් හොඳින් සැලසුම් කර ගැනීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ සහ ගණන්දීමේ නිලධාරීන්ගේ මූලික වගකීමක් වන හෙයින්, ඒ අනුව සකස් කරන ලද 2008 වාර්ෂික වියදම් සැලසුම් සහ වර්ෂය සඳහා වූ මාසික මුදල් අග්‍රිම අවශ්‍යතාවය පිළිබඳ වාර්තා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත 2008.01.15 දින හෝ ඊට ප්‍රථම ඉදිරිපත් කළ යුතුවේ.

3.2 2008 මුද්‍රිත ඇස්තමේන්තුවල `අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම්` ව්‍යාපෘතිය යටතේ නිශ්චිතව සඳහන් කළ කාර්යයන් හැරුණු විට, ඉන් පරිබාහිර කරුණක් සඳහා අතිරේක ප්‍රතිපාදන සලසා දීමට හැකියාවක් නොමැති බවත්, අනපේක්ෂිත තත්ත්වයන් සඳහා මුහුණ දීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන පවත්වා ගත යුතු බැවින් පරිපූරක ඇස්තමේන්තු සලකා බැලිය හැක්කේ ප්‍රමාණවත් ආදායම් මාර්ග හඳුනා ගැනීමෙන් පසුව බවත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරී / ගණන් දීමේ නිලධාරීන්ගේ අවධානයට යොමු කරනු ලැබේ.

3.3 අනපේක්ෂිත සහ හදිසි මෙන්ම රජයේ ප්‍රමුඛ කාර්යයක් ලෙස ඉටු කළ යුතු වියදම් වැඩසටහන් සඳහා භාණ්ඩාගාරයට ඉල්ලීම් ඉදිරිපත් කළ යුත්තේ 2007.07.25 දිනැති අංක 136 දරන `2008 අයවැය කැඳවීම` පිළිබඳ චක්‍රලේඛයේ 2 වන සටහනේ දැක්වෙන වියදම් කළමනාකරණය ක්‍රමවේදයන්ට අනුකූල වන පරිදි විය යුතුය. මෙහිදී එම වියදම් වැඩසටහන් සම්බන්ධව ප්‍රමාණවත් පැහැදිලි කිරීම් සහ සනාථ කිරීම්ද ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. එසේම අතිරේක මූල්‍ය අවශ්‍යතාවයන් පිළිබඳ ඉල්ලීම් ඉදිරිපත් කිරීමට පෙර තම වැය ශීර්ෂයන්හි වියදම් නොවූ ප්‍රතිපාදන ප්‍රමාණයන් හෝ ආරම්භ කරනු නොලැබූ කාර්යයන් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන, ඒ සඳහා යොදවා ගැනීමේ ඇති හැකියාව පිළිබඳව ප්‍රථමයෙන් සොයා බැලීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් / ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමකි.

3.4 ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් ඉක්මවීමේ තත්ත්වයන් තුළ ප්‍රාග්ධන වියදම් අඩුවීමේ ප්‍රවණතාවයන් ඇති වන බැවින් පුනරාවර්තන වියදම් පාලනය කර ගැනීමත්, එවැනි වියදම් වැඩිවන යෝජනා පිළිබඳ දැඩි ලෙස අවධානය යොමු කිරීමත් කළ යුතු වේ.

## 4. රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

4.1 පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද විසර්ජන පනතේ දැක්වෙන උපරිම වියදම් සීමාව තුළ අත්තිකාරම් ගිණුම් කටයුතු කළමනාකරණය කර ගත යුතු බැවින් 2008 ජනවාරි 01 දින සිට ආපදා ණය ගෙවීමේ දී පහත සඳහන් උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ.

(අ) දීමනා හැර මූලික වැටුප පදනම් කර ගෙන ආපදා ණය ගෙවිය යුතුය.

(ආ) පළමු වතාවට ආපදා ණය ඉල්ලුම් කරන මාණ්ඩලික නොවන කණිෂ්ඨ ශ්‍රේණිවල සේවකයින් සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

(ඇ) පොරොත්තු ලේඛනයක් නඩත්තු කරමින් එම පොරොත්තු ලේඛනයේ අනුපිළිවෙල අනුව ගෙවීම් කළ යුතුය.

(ඈ) 2007 දෙසැම්බර් 31 වන දින වනවිට ලැබී ඇති ණය ඉල්ලුම්පත්‍ර හා 2008 වර්ෂයේ දී ලැබේ යැයි අපේක්ෂා කරන ණය ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව අනුව, 2008 වර්ෂයේ දී ලබා දී ඇති උපරිම වියදම් සීමාව තුළ එම ඉල්ලුම්පත්‍ර සියල්ලම සඳහා ගෙවීම් කළ නොහැකි නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අභිමතය අනුව සියළුම සේවකයින්හට සාධාරණයක් ඉටු වන පරිදි සෑම ණය ඉල්ලුම්පත්‍රයකටම ණය මුදලක් ලබා ගත හැකි වන ආකාරයට 4.1(ආ) ඡේදය යටතේ ඇති ණය ඉල්ලුම්පත්‍ර වලට හැර උපරිමයක් නියම කළ හැක.

(ඉ) ණය අත්තිකාරම් ගෙවීමේ දී පහත සඳහන් ප්‍රමුඛතාවයන් අනුව කටයුතු කළ යුතුය.

I. උත්සව අත්තිකාරම්
II. විශේෂ අත්තිකාරම්
III. ආපදා ණය
IV. පාපැදි ණය

(ඊ) අවම ලැබීම් සීමාව හා උපරිම හර ශේෂ සීමාව සාධාරණ හේතු මත සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

## 5. වාණිජ කටයුතු අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද උපරිම වියදම් සීමාව දැඩි සේ පිළිපැදිය යුතුය. අවම ලැබීම් සීමාව සහ උපරිම හර ශේෂ සීමාවන් සඳහා පිළිගත හැකි සාධාරණ කරුණු ඉදිරිපත් කරනු ලබන්නේ නම් පමණක් ප්‍රතිශෝධනය සඳහා සලකා බලනු ලැබේ.

## 6. 2008 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

2008 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා කඩිනමින් ආරම්භ කර, සැලසුම්ගත කාලපරිච්ඡේද තුළදී අවසන් කිරීමද අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ වගකීමකි. 2008 වසර සඳහා ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා වලින් ඔබ අමාත්‍යාංශයට අදාල වියදම් යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර නොපමාව ගතයුතු අතර ඒ සඳහා ඔබ විසින් සකස් කරනු ලැබූ ක්‍රියාකාරී සැලසුම් 2008.01.26 දිනට ප්‍රථම ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවටද පිටපතක් සහිතව ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

7. පොදු කරුණු

`මහින්ද චින්තන; නව ශ්‍රී ලංකාවක් කරා, දස අවුරුදු දැක්ම - සංවර්ධන ප්‍රතිපත්ති රාමුව 2006-2016` මගින් අපේක්ෂිත අරමුණු සහ ඉලක්ක ඉටු කර ගැනීමේ ක්‍රමෝපායන් සැලකිල්ලට ගනිමින් මධ්‍ය කාලීන අයවැය රාමුව තුළ 2008 වර්ෂය සඳහා අනුමත කර ඇති ප්‍රතිපාදන මහා මූල්‍ය විනයකින් යුක්තව වියදම් දැරීමට කටයුතු කිරීම සියළුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමක් වේ. ඒ අනුව මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පිළිපැදීම ප්‍රමුඛ වගකීමක් සේ සලකා කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි. අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ තම අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ප්‍රධානීන් කැඳවා වියදම්වල ප්‍රගතිය හා ඵලදායිතාවය පිළිබඳව අඛණ්ඩව සමාලෝචනය කළ යුතුය.

මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු පිළිබඳව අවශ්‍ය පැහැදිලි කර ගැනීම් ඒ ඒ වියදම් ආයතන සම්බන්ධීකරණය කරනු ලබන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාල නිලධාරීන් අමතන මෙන් කාරුණිකව දන්වමි. (එම නිලධාරීන්ගේ නම් හා දුරකථන අංක සඳහන් උපලේඛනයක් මීට අමුණා ඇත.)

8. මෙම චක්‍රලේඛය භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද්දක් බවට සනාථ කර ගැනීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ හිරන්සා කළුතන්ත්‍රි මහත්මිය - දුරකථන අංක 011-2484578 විමසිය හැකිය.

පී.බී.ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත : විගණකාධිපති

| ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ඇමතුම් විස්තර | | | |
|---|---|---|---|
| නම | තනතුර | දුරකථනය | අනුයුක්ත අමාත්‍යාංශය |
| ඩී. අබේසූරිය මහතා | අධ්‍යක්ෂ | 2484673 | අන්තිකාරම් ගිණුම් කටයුතු |
| ගැමුණු සමරසිරි මහතා | අධ්‍යක්ෂ | 2484579 | කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය<br>ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය<br>විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය |
| මහින්ද සාලිය මහතා | අධ්‍යක්ෂ | 2484689 | ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය<br>අභ්‍යන්තර පරිපාලන අමාත්‍යාංශය |
| ජ්. කේ. සෙනෙවිරත්න මහතා | අධ්‍යක්ෂ | 2484684 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය<br>පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය |
| චාන්දනී විජයවර්ධන මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2484582 | නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය<br>නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය<br>ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය<br>ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යාංශය |
| මලර්මදී ගංගාදරන් මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2484867 | මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය |
| අජිත් අබේසේකර මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2484896 | වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය<br>ඛණිජ තෙල් හා ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය<br>විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය<br>ප්‍රවාහන අමාත්‍යාංශය |
| ක්‍රිස්ටින් පෙරේරා මෙය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2484858 | අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළඳාම කටයුතු අමාත්‍යාංශය<br>ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය<br>වෙළඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශය<br>සංචාරක අමාත්‍යාංශය |
| අනෝජා මුණසිංහ මෙය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2484683 | කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය<br>ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය<br>වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය |
| රුක්මාල් අබයවික්‍රම මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2484895 | සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය<br>දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| ගීතා විමලවීර මෙය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2484677 | ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය<br>ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය |
| ජ්. එම්. සුනිල් ගුණවර්ධන මහතා | සහකාර අධ්‍යක්ෂ | 2484687 | ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය<br>පාර්ලිමේන්තුව<br>පාර්ලිමේන්තු සභානායකතුමාගේ කාර්යාලය<br>පාර්ලිමේන්තු ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය<br>පාර්ලිමේන්තු විපක්ෂ නායකතුමාගේ කාර්යාලය<br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව<br>රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br>අධිකරණ සේවා කොමිෂන් සභාව<br>ජාතික පොලිස් කොමිෂන් සභාව<br>පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය<br>අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව<br>මැතිවරණ දෙපාර්තමේන්තුව<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව<br>පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය<br>මුදල් කොමිෂන් සභා කාර්යාලය<br>ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |

| නම | තනතුර | දුරකථනය | අනුයුක්ත අමාත්‍යාංශය |
| --- | --- | --- | --- |
| හිරන්සා කළුතන්ත්‍රි මිය | සහකාර අධ්‍යක්ෂ | 2484578 | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය<br>අතිගරු ජනාධිපති<br>ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු<br>අමාත්‍ය මණ්ඩල කාර්යාලය<br>හිටපු ජනාධිපතිතුමාගේ කාර්යාලය (ගරු ඩී.බී.විජේතුංග)<br>හිටපු ජනාධිපතිතුමාගේ කාර්යාලය (ගරු සී.බී.විජේතුංග) |
| අනෝමා නන්දනී මිය | සහකාර අධ්‍යක්ෂ | 2484685 | සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය<br>නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යාංශය<br>ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය<br>ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශය<br>විදේශ කටයුතු අමාත්‍යාංශය |
| චන්දන වික්‍රමසූරිය මහතා | සහකාර අධ්‍යක්ෂ | 2484760 | අධ්‍යාපන අමාත්‍යාංශය<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය |
| ජූඩ් නිලුක්ෂාන් මහතා | සහකාර අධ්‍යක්ෂ | 2484564 | අයවැය මෙහෙයුම් හා පද්ධති කළමනාකරණ අංශය |
| විමල් ලියනගම මහතා | සහකාර අධ්‍යක්ෂ | 2484686 | කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය<br>වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය<br>විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය |
| තාරක දේවප්‍රිය මහතා | සහකාර අධ්‍යක්ෂ | 2484679 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය<br>පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය<br>පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය |
| පී. සිවශන්කර් මහතා | සහකාර අධ්‍යක්ෂ | 2484581 | තරුණ අභිවෘද්ධි හා සමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය<br>තැපැල් හා විදුලි සංදේශ කටයුතු අමාත්‍යාංශය<br>තරුණ කටයුතු අමාත්‍යාංශය<br>ප්‍රජා සංවර්ධන හා සමාජ අසමානතා දුරුකිරීමේ අමාත්‍යාංශය |
| ප්‍රසන්න කිරිවත්තුඩුව මහතා | සහකාර අධ්‍යක්ෂ | 2484688 | ව්‍යවස්ථා කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය<br>පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය<br>සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br>ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය<br>ආගමික කටයුතු හා සදාචාර වර්ධන අමාත්‍යාංශය |
| එම්. එෆ්. කේ. නිසා මිය | සහකාර අධ්‍යක්ෂ | 2484580 | අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යාංශය<br>රාජ්‍ය වතු කළමනාකරණ සහ සංවර්ධන අමාත්‍යාංශය<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| උදේනි තිලකරත්න මහතා | සහකාර අධ්‍යක්ෂ | 2484853 | සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය<br>විශේෂ ව්‍යාපෘති අමාත්‍යාංශය |